(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 83.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 අගෝස්තු 01 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

**ගරු වමල් රාජපක්‍ෂ මහතා**

**ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා**

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු විදුර වික්‍රමනායක මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු ඩුලිප් විජේසේකර මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ මගීන් හෝ භාණ්ඩ සඳහා වන සියලුම පොදු ප්‍රවාහන සේවාවන් අත්‍යාවශ්‍ය මහජන සේවාවන් බවට පත් කරමින් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව, 2019 ජුලි 27 දිනැති අංක 2133/65 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. වෙළඳ නැව් (සංශෝධන) :** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2019 අගෝස්තු 08 වැනි බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධිකෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**3. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා, ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මරණ දණ්ඩනය අහෝසි කිරීම සහ ආනුෂංගික විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

52(6) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය වෙත පවරන ලදී.

**4. ශෝක ප්‍රකාශ යෝජනා** : ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, අභාවප්‍රාප්ත ගරු සේනරාජා සමරනායක මහතා, ගරු අබ්දුල් රසාක් මන්සූර් මහතා, ගරු වී. කේ. ඉන්දික මහතා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන ලදී.

"ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා, ගරු ශාන්ත බණ්ඩාර මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.30 ට ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 2.15 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු සේනරාජා සමරනායක මහතා, ගරු අබ්දුල් රසාක් මන්සූර් මහතා, ගරු වී. කේ. ඉන්දික මහතා යන මහත්වරුන්ගේ අභාවයන් පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් ඊට එක් වූ කථානායකවරයා මෙම යෝජනාවන්ට සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපත් ශෝකයට පත් පවුල්වල අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරන ලදී.

**5. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 3.19 ට, 2019 අගෝස්තු 06 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.